# ශ්‍රී ලංකාවේ සංගීත අධ්‍යාපනයේ විකාශය

# හා එහි නූතන ප්‍රවණතා

**එම්. අයි. එස්. ද සිල්වා වීරක්කොඩි**

## නිබන්ධ සාරාංශය

මෙම අධ්‍යයනය මගින් උත්සාහ කරනු ලැබ ඇත්තේ ශ්‍රී ලංකාවේ සංගීත අධ්‍යාපන විකාශය හා එහි නූතන ප්‍රවණතා පිළිබඳ විමසා බැලීමට ය. ඒ අනුව ලංකාවේ සංගීත අධ්‍යාපනය කිනම් වකවානුවක ඇරඹිණි ද, එහි ගමන්මග කෙබ ඳු ද, එහි වර්තමාන ස්වභාවය හා එයට ඇති අභියෝග කවරේ ද, එම අභියෝග ජය ගැනීම උදෙසා ගත හැකි ක්‍රියාමාර්ග කවරේ ද යන්න විමසා බැලීමට මෙමගින් යත්න දරා ඇත.

ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ සෞන්දර්ය විෂයක් ලෙස පෙරදිග සංගීතය ආරම්භ වී ඇත්තේ 1928 තරම් ඈත කාලයක දී වන අතර, වර්තමානයේ එම විෂය පශ්චාද්-උපාධි මට්ටම දක්වා වර්ධනය වී ඇත. එහෙත් මෙම සංගීත අධ්‍යාපන ක්ෂේත්‍රය සම්බන්ධ ව සිදු කරනු ලැබ ඇති ශාස්ත්‍රීය පර්යේෂණ ඉතාමත් විරල බව මෙහි දී අවබෝධ වූ කරුණකි. එම නිසා දේශීය මෙන් ම විදේශීය වශයෙන් විවිධ විද්වතුන් විසින් පළ කරන ලද ශාස්ත්‍රීය ග්‍රන්ථ හා ඔවුන ගේ අදහස් මෙන් ම සංගීත ක්ෂේත්‍රයට අදාළ චක්‍රලේඛ, වාර්ෂික වාර්තා, සංඛ්‍යා ලේඛන, අත්පොත්, අධ්‍යාපන මොඩියුල යනාදිය ඇසුරෙන් මෙම පර්යේෂණය සඳහා අවශ්‍ය තොරතුරු සම්පාදනය කරගන්නා ලදී. ඒ අනුව සමස්ත සංගීත ගුරු ප්‍රජාව ආවරණය වන පරිදි දිස්ත්‍රික් කිහිපයකින් තෝරාගත් අහඹු ගුරු නියැදියක් වෙත සංවෘත ප්‍රශ්නාවලියක් යොමු කිරීමෙන් ගුරු ආකල්පය විමර්ශනය කළෙමි. එමෙන් ම අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගය සඳහා පෙනී සිටි සමස්ත පෙරදිග සංගීත ශිෂ්‍ය ප්‍රජාව නියෝජනය වන පරිදි 10% ක ශිෂ්‍ය නියැදියක් විශ්ලේෂණය කිරීමෙන් නිගමන කරා එළඹීමට උත්සහ දරන ලදී.

සංගීත විෂයේ විකාශය පිළිබඳ විමසීමේ දී එය දශක අටකට වැඩි දීර්ඝ ඉතිහාසයක් දක්වා ගමන් කරන බවත්, විවිධ වකවානුවල දී නොයෙක් වෙනස්කම්වලට භාජනය වෙමින් වර්තමානය දක්වා ම අඛණ්ඩ ව පැවති විෂයක් බවත් අනාවරණය විය. පසුගිය දශකය දෙස විශේෂ අවධානය යොමු කිරීමේ දී පෙරදිග සංගීත විෂය ක්ෂේත්‍රය ආශ්‍රිත ව මූලික ව හඳුනාගත හැකි ප්‍රවණතා රාශියක් වේ.

කෙසේ වුව ද, දත්ත විශ්ලේෂණය කිරීමේ දී අනාවරණය වූ ප්‍රධානතම කරුණක් වන්නේ මෙකී විෂයට තිබූ සාපේක්ෂ වැදගත්කම ක්‍රමයෙන් හීන වී ඇති බව ය. නැතහොත් සංගීත විෂය මෙරට අධ්‍යාපන විෂය ක්ෂේත්‍රය තුළින් ගිලිහෙමින් පවතින බව කැපී-පෙනුණි. තව ද මෙකී විෂය ක්ෂේත්‍රය ආශ්‍රිත ව හඳුනාගත හැකි ගැටලු කිහිපයකි. එනම්, පාසල් විෂය මාලාව තුළ නිසි තැන හිමි නොවීම, ලිඛිත හා ප්‍රායෝගික පරීක්ෂණය සඳහා නොපැමිණි ශිෂ්‍ය සංඛ්‍යාව ඉහළ අගයක් ගැනීම, ගුරුවරුන් ගේ උදාසීන බව, පරිපාලන දායකත්වය අවම වීම, මූලික පහසුකම් තවමත් ප්‍රමාණවත් නොවීම යනාදිය ඒ අතර වේ.

පෙරදිග සංගීත විෂය තව දුරටත් මෙරට අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ රඳවා තබාගත යුතු විෂයක් වන බැවින් එය සුරක්ෂිත කිරීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීමේ අවශ්‍යතා ව ඉස්මතු ව ඇති බව පෙනේ. ඒ අනුව විෂයේ ප්‍රගමනය උදෙසා අනුගමනය කළ හැකි වෙති යි අපේක්ෂිත ක්‍රියාමාර්ග කිහිපයකි. ඒ අතර සංගීත ගුරුවරයා ගේ නිසි ගෞරවය හා වෘත්තීයමය තත්ත්වය නගා සිටුවීම, ගුරු පුහුණුව යාවත්කාලීන කිරීම, සංගීත අධ්‍යාපන කළමනාකරණය විධිමත් කිරීම, සංගීත අධ්‍යාපනයට අදාළ මූලික පහසුකම් ප්‍රවර්ධනය කිරිම, නිපුණතා පාදක අධ්‍යාපනය තුළ ශිෂ්‍ය කාර්යය ප්‍රබල කිරීම යනාදිය වේ. මෙකී යෝජනා ක්‍රියාවට නැංවීමට හැකියාවක් තිබේ නම් දශක අටකට වැඩි ඉතිහාසයක් ඇති පෙරදිග සංගීත විෂය වර්තමානයේ පවතින තත්ත්වයට වඩා යම් ප්‍රමාණයකින් හෝ නගා-සිටුවීමට හැකි වෙති යි අපගේ විශ්වාසය යි. ඒ සඳහා වගකිවයුත්තන් ගේ මෙන් ම ගුරු සිසු පරපුරේ ද අවධානය යොමු විය යුතු කාලය එළඹ ඇති බව අවධාරණය කළ යුතු වේ.